# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,948- 2016 ජනවාරි මස 01 වැනි සිකුරාදා - 2016.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 46 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 46 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 51 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 22 වැනි දින පළකරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2016 ජනවාරි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

45 - B 81017— 5,402 (2016/01)
F 1 -

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR)**

ප්‍රසම්පාදන දැන්වීමයි

M 9 දුම්රිය එන්ජින් (LOCOMOTIVES) 02 ක, ප්‍රකර්ෂණ බල පද්ධති (TRACTION POWER SYSTEM සහ ජංගමක පාලන පද්ධති (LOCOMOTIVE CONTROL SYSTEM) නැවත සැලසුම් නිර්මාණය කර නිෂ්පාදනය කිරීම සහ ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය SRS/F. 7188

ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (SLR) හි M 9 දුම්රිය එන්ජින් (Locomotives) 02 ක ප්‍රකර්ශන බල පද්ධති (Traction Power System) ජංගමක පාලන පද්ධති (Locomotive Control System) නැවත සැලසුම් නිර්මාණය කර, නිෂ්පාදනය කර ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා, නිෂ්පාදකයින්/ලංසුකරුවන් සහ වෙනත් යෝග්‍යතා/නිපුණතා පූර්ණ ආයතන වෙතින්, මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

ලංසුකරුවන්ට, ස්වකීය ලංසු, සෘජුවම හෝ ඔවුන් විසින් ඇටර්නි බලය මගින් බලය පවරන ලද සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලයලත් නියෝජිතවරයෙකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකි ය.

2. ලංසු භාරගැනීම 2016.02.12 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් වේ.

3. ලංසු ශ්‍රී ලංකා රුපියල් විසිදහසක (රු. 20,000) ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, 2015.12.14 වැනි දින සිට 2016.02.11 වැනි දින දක්වා සමාන්‍ය රාජකාරි දිනවලදී, (ශ්‍රී ලංකා වේලාවෙන්) පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලංසු ලිපිලේඛන සමඟ ලබාගත හැකි ආකෘතිපත්‍ර මත ඉදිරිත් කළ යුතු ය. විදේශීය ගැනුම්කරුවන්ට, ඉහත සඳහන් නියමිත දිනවල, ස්වකීය රටවල ශ්‍රී ලංකා තානාපති (දූත) කාර්යාලවලට විදේශීය මුදල් වර්ගවලට මාරුකර ගත හැකි මුදල් වර්ගයකින් ශ්‍රී ලංකා රුපියල් විසි දහසකට (රු. 20,000) සමාන මුදලක් ගෙවා ලංසු ලේඛන, ශ්‍රී ලංකාවේ තානාපති (දූත) කාර්යාලය මාර්ගයෙන් එවන ලෙස, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි වෙතින් ඉල්ලීමක් කළ හැකි ය. ඉහත සඳහන් රුපියල් විසි දහසක (රු. 20,000) ක ප්‍රසම්පාදන ගාස්තුව (විදේශීය පරිවර්ත්‍ය මුදල් වර්ගයකින්) ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් වනු ඇත.

4. ලංසු, එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 01 හි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ දී විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට පැමිණ සිටින මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

5. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් අය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම කළ යුතු ය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 1, ඩී. ආර්. විජයවර්ධන මාවත,
කොළඹ 10. ශ්‍රී ලංකාව.

6. ලංසු ලිපිලේඛන ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

7. වැඩිදුර විස්තර සඳහා කරුණාකර විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94(11)2438078 හෝ
94 (11) 2436818
ෆැක්ස් : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

යොමු අංකය : SRS/F.7188

01-226

---

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

200 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ක්ලයිමේට් ඇන්ඩ් ෆොරෙස්ට් ඇකෂන් නෙට්වර්ක් | පී. ඒ. 3101 | 2015.11.11 | අංක 20 ඒ, කුරුප්පු පාර, කොළඹ 08 |

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී.
සමාගම් ලේකම්වරු.

01-175

## දැන්වීමයි

පහත සඳහන් සමාගම් ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

| *සමාගමෙ නම* | *සමාගමේ අංකය* | *ලියාපදිංචි කාර්යාලය* | *ලියාපදිංචි කළ දිනය* |
|---|---|---|---|
| සිලෝන් ෆුන්වයිස් චෙම්බර්ස් (පීවීටී) එල්ටීඩී | පී වී 109835 | අංක 98/2, ජාවත්ත පාර, කොළඹ 5 | 2015.11.16 |
| ද ෆෝලන් ට්‍රී රිසෝට් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 109785 | ''ලුම්බිණි'' වගුරුවෙල, බුත්තල | 2015.11.16 |
| ඩෙක්ස් ඇන්ඩ් කැබින්ස් (පීවීටී) එල්ටීඩී | පී වී 110209 | අංක 98/2, ජාවත්ත පාර, කොළඹ 5 | 2015.12.02 |
| ෆෝචූන් 20 ටුවෙන්ටි (පී වී ටී) එල්ටීඩී | පී වී 110211 | අංක 98/2, ජාවත්ත පාර, කොළඹ 5 | 2015.12.07 |

ලීඩ්ස් කෝපරේට් ස්ර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අංක 98/2, ජාවත්ත පාර,
කොළඹ 5.

01-257

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ගම්පොල, නුවර පාර, 1 වන පටුමග, දේවරාජා මාවත, අංක 240/72 දරන ස්ථානයේ පදිංචි අබ්දුල් කාදර් කාමිලා උම්මා වන මා විසින් ගම්පොල, නුවර පාර, අංක 407/3 දරන ස්ථානයේ පදිංචි අබ්දුල් සතාර් යන අයට මා විසින් ලබා දී ඇති වර්ෂ 2011 ක්වූ නොවැම්බර් මස 24 වැනි දින එම්. අයි. එම්. මුබාරක් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ අංක 589 දරන ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බල රහිත කරන බව දන්වා සිටිමි.

අබ්දුල් කාදර් කාමිලා උම්මා.

01-01

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කොළඹ 13, විවේකානන්ද පාර, අංක ඩී/2/1 දරන ස්ථානයේ පදිංචි රණසිංහ ආරච්චිගේ ඇනස්ටින් පෙරේරා වන මා විසින් කොළඹ 13, විවේකානන්ද පාර, ජාතික නිවි හැම්, අංක ඩී/2/1 දරන ස්ථානයේ පදිංචි දොන් අසන්ත අරුන්දික මායාදුන්න යන අයට මා විසින් ලබා දී ඇති වර්ෂ 2014ක් වූ ඔක්තෝබර් මස 07 වැනි දින එම්. අයි. එම්. මුබාරක් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ අංක 13532 දරන ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බල රහිත කරන බව දන්වා සිටිමි.

ආර්. ඒ. ඒ. පෙරේරා.

01-02

---

## දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තියේ ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : ජර්නිස්කේප්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 109665
ලියාපදිංචි කාර්යාලය : අංක 8, 2 වැනි පටුමග, දෙහිවල
සංස්ථාගත දිනය : 2015.11.06

සමාගම් ලේකම්වරු.

01-04

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ධූර්කා ඉම්පෝට්ස් ඇන්ඩ් එක්ස්පෝට්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 109951
ලියාපදිංචි දිනය : 2015.11.23
ලියාපදිංචි ලිපිනය : අංක 520 බී, මීගමුපාර, වත්තල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-07

## දැන්වීමයි

සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගමේ නාමය වෙනස් කළ බව මෙයින් දැනුම් දෙමු.

පෙර සමාගමේ නාමය : ග්‍රීන් වැලිස් ෂෙල්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
නව සමාගමේ නාමය : ජී වී එස් පී එල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 90466
ලියාපදිංචි ලිපිනය : අංක 12ඒ, 2/1 බම්බලපිටිය ටෙරස්, කොළඹ 04
නාමය වෙනස් කළ දිනය : 2015 නොවැම්බර් මස 09.

එම්. එන්. කේ. ප්‍රෝෆෙෂනල් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

01-09

---

## ඇටර්නි බලය අවලංගු කිරීම/ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, උණවටුන, එරමුදුගහ හන්දිය, රණවිරු අනුරුද්ධ මාවත, ''ස්ටාර්ලයිට් බන්ගලාව'' සහ නුගේගොඩ, පාසල් මාවත, ගර්ටන් රෙසිඩන්සීස් හි අංක 31 2/2 දරන ස්ථානයේ පදිංචි ගින්තොට පොල්වත්තගේ සුසිල් අශෝක වන මම රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තානාපති වෙනුවට 1981 අංක 4 දරන කොන්සල්වරුන්ගේ ආඥාපනත යටතේ සාමාදාන විනිශ්චයකාරවරයෙකු වන එම්. ජොන් ඒ. ප්‍රනාන්දු (M. John A. Fernando - Counsellor) විසින් වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 07 වැනි දින සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ජනරජයේ, ගාල්ල, තල්පේ, ගාලු පාර, අංක 80615 දරන තැන පදිංචි ද මෙල් විදානලාගේ ටයිටස් ප්‍රසංග නැමති අයට ලබා දුන් ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව, ශ්‍රී ලංකා රජයත් සියලු මහජනතාවත් අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා.

එකී ඇටර්නි බලපත්‍රයේ සඳහන් ඇටර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ ගණුදෙනු සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාරගනු නොලබන බව ද සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා.

ගින්තොට පොල්වත්තගේ සුසිල් අශෝක.

01-64

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර දැන්වීමයි

සමාගමේ නාමය : ද යුනයිටඩ් හෝල්ඩින්ස් සර්විසස් (පෞද්ගලික) සමාගම
සංස්ථාපනය කරන ලද දිනය : 2012.01.06
ලියාපදිංචි අංකය : පී වී 83563
ලියාපදිංචි ලිපිනය : අංක 1180, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

සමාගම් ලේකම්.

01-94

---

## ග්ලෝබල් කොමොඩිටි ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය : පී වී 1180

සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම

2015 දෙසැම්බර් මස 11 වැනි දින සමාගමේ පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (b) වගන්තිය යටතේ මෙම සමාගම 2015 දෙසැම්බර් මස 11 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

ජගත් හේවගේ,
දිල්රුක්ෂි එම්. ආර්. හේවගේ,
අධ්‍යක්ෂවරු.

2015 දෙසැම්බර් මස 14 වැනි දින.

01-97/1

---

## ග්ලෝබල් කොමොඩිටි ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය : පී වී 1180

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ සමාගමේ ඈවරකරු පත්කිරීමේ දැන්වීම

කොළඹ 04, කාසල් පටුමගේ අංක 11 හි තුන්වන මහලෙහි පදිංචි ජී. ජේ. ඩේවිඩ් වන මම 2015 දෙසැම්බර් මස 11 වැනි දින කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 223, දරන ස්ථානයේ පිහිටි ග්ලෝබල් කොමොඩිටි ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් හි පැවති විශේෂ මහා සභා රැස්වීමේ සාමාන්‍ය යෝජනා සම්මතයෙන් එම සමාගමේ ඈවරකරු වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

ජී. ජේ. ඩේවිඩ්,
ඈවරකරු,
ග්ලෝබල් කොමොඩිටි ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්.

එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත හා ආයතනික අයකර ගැනීම්,
තුන්වන මහල, අංක 11,
කාසල් පටුමග,
කොළඹ 04.
2015 දෙසැම්බර් මස 14.

01-97/2

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ග්ලාසස් එල්කේ හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී
2. සංස්ථාගත කළ දිනය : 2015.12.07
3. සමාගමේ අංකය : පී වී 110276
4. ලියාපදිංචි ලිපිනය : අංක 17, දෙවැනි පටුමග, කව්ඩාන බ්‍රෝඩ්වේ, දෙහිවල.

ලේකම්,
එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,

අංක 67ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

01-100

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 4/431 මිඩ්ල්බරෝ රෝඩ්, බොක්ස් හිල් VIC 3128, ඕස්ට්‍රේලියාව යන ලිපිනයේ පදිංචි ශ්‍යාමිණි මේනකා කරුණාරත්න (විවාහයට පෙර සෙනරත් පතිරණ) වන මාගේ ඇටෝර්නි බලකරු වන කව්ඩාන, දෙහිවල පදිංචි අභය සෙනරත් පතිරණ යන අයට ස්වකීය වර්තමාන වයසට අනුව එම තනතුරේ තවදුරටත් කටයුතු කිරීමට අපහසු හෙයින් ඔහු වෙත මා විසින් ප්‍රදානය කරන ලද දෛනික පොත් අංක 1479 සහ 86 වන පත්තිරුවේ 27 වන වෙළුම යටතේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ බස්නාහිර කලාප කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලපත්‍රය මෙතැන් පටන් මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන බව ද, එකී ඇටෝර්නි බලපත්‍රය මත එකී ඇටෝර්නි බලකරු විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙනුවක් සම්බන්ධයෙන් මාගේ වගකීමක් නොමැති බව ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ පොදු මහජනතාව වෙත මෙයින් නිවේදනය කර සිටිනු ලබන බවට සියලු දෙනාම මෙයින් දැනගනිත්වා.

ශ්‍යාමිණි මේනකා කරුණාරත්න
(විවාහයට පෙර සෙනරත් පතිරණ)

01-127

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2015 දෙසැම්බර් මස 03 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : අනොප් ඇන්ඩ් නස්ලින් ඇසෝසියේට්ස් (පුද්ගලික) සමාගම
සමාගම් අංකය : පී වී 110213
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 3/11, බේකර්ස් ෆාම් පාර, මහගස්තොට, නුවරඑළිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ්
සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

01-154

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර හීරැස්සගල පාර, අංක 249 දරන ස්ථානයේ පදිංචි ආනන්ද පරාක්‍රම පලීපාන වන මම කුරුණෑගල සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (වයඹ උතුරු මැද කලාපය) කාර්යාලයේ ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර පොතේ 28 වන කාණ්ඩයේ 1308 පත්ඉරුවේ 1223 දිනපොත් අංකය යටතේ 2009.07.07 ලියාපදිංචි කර ඇටර්නි බලපත්‍රය 2015.11.16 වැනි දින සිට අවලංගු කර ඇති බව මෙයින් දැනගනිත්වා ඒ අනුව කුරුණෑගල මිල්ලව හිටිනාවත්ත දරන තැන පදිංචි රන්තිලක දූරයලාගේ නිමල් කරුණාතිලක යන අය තවදුරටත් මාගේ ඇටර්නි බලකරු නොවන බව ප්‍රකාශ කර සිටිමි.

ආනන්ද පරාක්‍රම පලීපාන.

2015 නොවැම්බර් මස 23 වැනි දින.

01-155

---

### නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : හිලියෝස් සිලෝන් පුද්ගලික සමාගම
සමාගමේ අංකය : පීවී 110165
සමාගම් ලියාපදිංචි කාර්යාලය : අංක 45, විහාර මාවත, පැපිලියාන
සංස්ථාගත කිරීමේ දිනය : 2015.12.01

සමාගම් ලේකම්වරු.

01-156

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : මහගෙදර රිට්රීට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 110272
ලියාපදිංචි ලිපිනය : අංක 69, වාලුකාරාම පාර, කොළඹ 03.

සමාගම් ලේකම්.

01-171

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි

ලියාපදිංචි අංක : පී වී 107598 දරන කොළඹ 15, අලුත් මාවත පාරේ, අංක 562 ඒ දරන ලිපිනයෙහි මෙඩි සර්කල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2015 අගෝස්තු මස 07 වැනි දින සංස්ථාගත කොට ඇත.

අධ්‍යක්ෂ.

01-172

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

සියල්ලන් ම එක්සත් රාජධානියේ පදිංචි 1. සතනනාදන් බේරේමිනාත් (එක්සත් රාජධානියේ ගුවන් ගමන් බලපත්‍ර අංක 515214942) 2. සතනනාදන් රගුනාත් (එක්සත් රාජධානියේ ගුවන් ගමන් බලපත්‍ර අංක 107671115) 3. සතනනාදන් සුරේන්ද්‍රනාත් (එක්සත් රාජධානියේ ගුවන් ගමන් බලපත්‍ර අංක 800384537) 4. සතනනාදන් ජේගනාත් (එක්සත් රාජධානියේ ගුවන් ගමන් බලපත්‍ර අංක 093045099) 5. සතනනාදන් විමල්නාත් (එක්සත් රාජධානියේ ගුවන් ගමන් බලපත්‍ර අංක 510194552) 6. සතනනාදන් දෙවිනාත් (එක්සත් රාජධානියේ ගුවන් ගමන් බලපත්‍ර අංක 308692008) 7. රමණී සතනනාදන් (එක්සත් රාජධානියේ ගුවන් ගමන් බලපත්‍ර අංක 308221348) 8. සතනනාදන් ගොබිනාත් (එක්සත් රාජධානියේ ගුවන් ගමන් බලපත්‍ර අංක : 30728208) වන අප විසින් යාපනය, අරියාලෙහි නුවර පාර, අංක 200/2, පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 417430210 වී) සන්මුගරාජා මාලඩ්විම් යන අය පත් කරමින් වර්ෂ 2014 ක්වූ මාර්තු මස 19 වැනි දින එක්සත් රාජධානියේ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ශ්‍රීකාන්ත්ලින්ගම් මහතා විසින් සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය අද දින 2015.08.20 පටන් අවලංගු කර අහෝසිකර ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන අතර නිත්‍යානුකූල ලෙස බලරහිත කරන බවය. වැඩිදුරටත් ප්‍රකාශ කර දනුම් දී සිටින්නේ එකී ඇටෝර්නි බලපත්‍රය මගින් කරන ලද බලය අනුව යම් පුද්ගලයෙකුට හෝ යම් ආයතනයකට කරනු ලබන සියලු පැවරුම් හෝ වෙනත් බලතල නිත්‍යානුකූල නොවන හා බල රහිත වන බවත් එම කටයුතු පිළිබඳව මා මින් ඉදිරියට වග නොකියන බවත් ය.

සතනනාදන් බේරේමිනාත්.

2015 අගෝස්තු මස 20 වැනි දින.

01-173

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : ඔමාන් ලංකා මිනරල්ස් එක්ස්ප්ලොරේෂන්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 107271
සංස්ථාගත කළ දිනය : 2015.07.23
සමාගමේ ලියාපදිංචි ලිපිනය : කයිකාවල වත්ත, කයිකාවල තැපෑල, මාතලේ, ශ්‍රී ලංකා.

01-176

---

## දැන්වීමයි

සමාගම් ලි. ප. කිරීමේ අංක පී බී 886 දරන සීමාසහිත අයි ජී එල් ලංකා සමාගම ස්වාධීනව ඈවර කිරීම පිළිබඳ 2007 අංක 07 දරන සමාගම් පනතේ 320 (1) ඡේදය යටතේ කරන නිර්දේශයයි.

සීමාසහිත අයි ජී එල් ලංකා සමාගමේ කොටස්කරුවන් විසින් 2015 දෙසැම්බර් මස 08 වැනි දින සම්මත කර ගන්නා ලද විශේෂ තීරණයක් මත ඉහත සමාගම සමාගම් පනතේ 319 (1) බී යටතේ ඈවර කිරීමටත්, එකී ඈවර කිරීමේ කටයුත්තේ දී සමාගම් පනතේ 326 (1) වගන්තියට ප්‍රකාරව ඈවරකරු වශයෙන් කොළඹ 04, ග්ලෙන් ආබර් පෙදෙස අංක 06 හි පදිංචි අබ්දුල් වහබ් මොහොමඩ් ඉම්තියාස් වන මා පත්කොට ඇති බවද මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අබ්දුල් වහබ් මොහොමඩ් ඉම්තියාස්,
සමාගමේ ඈවරකරු.

අංක 04, ග්ලෙන් ආබර් පෙදෙස,
කොළඹ 04.

01-208

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

ලියාපදිංචි නම : ශ්‍රීරාම් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 109943
ලියාපදිංචි දිනය : 2015.11.20
ලියාපදිංචි ලිපිනය : අංක 255/1, ස්ටැන්ලි පාර, යාපනය

ASMC (Pvt) Ltd,
දුරකථන අංක : 2506194

01-209

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය අනුව ෆොස්රොක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2015 නොවැම්බර් මස 30 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනය.

සමාගමේ නම : ෆොස්රොක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107479
ලියාපදිංචි ලිපිනය : 216, ද සේරම් පෙදෙස, කොළඹ 10

කෝපොරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලේකම්වරු.

ෆොස්රොක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

01-222

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සී/ස පාත් ස්ටඩි මෙඩිසින් (පුද්) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 109595
ලියාපදිංචි කළ දිනය : 2015.11.04
ලියාපදිංචි ලිපිනය : 58, සිරිකලාගිරි, දුටුගැමුණු මාවත, පාමංකඩ, දෙහිවල.

සමාගම් අධ්‍යක්ෂ.

01-243

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සී/ස ස්ටඩි මෙඩිසින් (පුද්) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 109600
ලියාපදිංචි කළ දිනය : 2015.11.04

සමාගම් අධ්‍යක්ෂ.

01-244

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සී/ස මල්ට්‍රාස් ලංකා (පුද්.) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 107848
ලියාපදිංචි කළ දිනය : 2015.08.20
ලියාපදිංචි ලිපිනය : 11/A පරණ කොළඹ පාර, හේවාගම, කඩුවෙල.

සමාගම් අධ්‍යක්ෂ.

01-245

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සී/ස ඔමායා ආයුර්වේදික් ට්‍රීට්මන්ට් සෙන්ටර් (පුද්.) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 106180
ලියාපදිංචි කළ දිනය : 2015.06.09
ලියාපදිංචි ලිපිනය : 51 1/1, පරණ කෝට්ටේ පාර, වැලිකඩ, රාජගිරිය.

සමාගම් අධ්‍යක්ෂක.

01-246

### දැන්වීමයි

පහත සඳහන් සමාගම් ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සංස්ථාගත කළ දිනය : 2015 දෙසැම්බර් 01
සමාගමේ නම : ජේ පී කේ එල් ඉංජිනියරින් ඇන්ඩ් ඩිවලොපර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 110167
ලියාපදිංචි කාර්යාලය : අංක 2බී, සිරිපාල පාර, ගල්කිස්ස.

එච්. චතුරිකා ලක්මිණි,
සමාගම් ලේකම්.

අංක 82 සී,
කටුවාවල, බොරලැස්ගමුව.

01-249

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කර ඇත.

සමාගමේ නම : පී. පී. එස්. කේ. ඇසෝසියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 91211
සංස්ථාගත කළ දිනය : 2013 පෙබරවාරි 26 දින
සමාගම් ලිපිනය : අංක 95 ''සෙත්සිරි නිවස'' නාගහවත්ත පාර, මහරගම.

ඩබ්ලිව්. ඒ. ඒ. ජී. සිල්වා,
සමාගම් ලේකම්වරු.

අංක 85, ඇලබඩවත්ත, හැඳල,
වත්තල.

01-260

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

කැලණි ගඟ මිල් පාරේ, අංක 64 හි පදිංචි ජෝශප් ජෝන් බර්ච්මන් ද අල්විස් (ජාතික හැඳුනුම්පත් අංක 442052484 V දරන) වෙත ම විසින් ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. අම්ර්තනාදර් විසින් ලියා සහතික කරන ලද 2015 ජුනි මස 17 වැනි දින දතම හා අංක 498 දරන ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බව පොදු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

අත්තටගේ කාලිංග ජයන්ත්,

අංක 26/7ඒ, 2 වැනි පටුමග,
විමලවත්ත, එස්ටේට්, නුගේගොඩ.

01-87

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව - ගාල්ල කොටුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2016.01.21 වැනි දින පෙ. ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ ගාල්ල මහ නගර සභා සීමාවේ කුඹල්වැල්ලේ රිච්මන්ඩ් කන්ද පාරේ වරිපනම් අංක 24 දරන කලාසිගෙවත්තේ බෙදා වෙන් කළ අංක 01 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. අඹවත්ත මහතා විසින් 2005.10.19

දින මැන සාදන ලද අංක 1007 දරන පිඹුර ප්‍රකාර අංක 01 දරන පර්චස් දහතුනයි දශම බිංදුවයි හයක් (අක්. 0, රූඩ්. 0, පර්.13.06) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

ඉහත කී ඉඩමට යෑම් ඒම් සඳහා පහත සඳහන් ඉඩම්වල මාර්ග පරවශතා අයිතිය ද වේ.

01. කුඹල්වැල්ලේ පිහිටි රිච්මන්ඩ් කන්ද පාරේ කලාසිගෙවත්තේ වරිපනම් අංක 22 සහ 24 දරන කැබලිවලට යාම සඳහා ඇති ප්‍රවේශ මාර්ගය වන අංක 04 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු සී. ආර්. අඹවත්ත මහතා විසින් 1971.06.14 වැනි දින මැන සාදන ලද අංක 213 දරන පිඹුර ප්‍රකාර එකී අංක 04 දරන පර්චස් දශම පහයි තුනක් (අ. 0, රූ. 0, පර්. 0.53) විශාල ඉඩම වේ.

02. කුඹල්වැල්ලේ පිහිටි රිච්මන්ඩ් කන්ද පාරේ කලාසිගෙවත්තේ වරිපනම් අංක 22 සහ 24 දරන කැබැලිවලට යාම සඳහා ඇති ප්‍රවේශ මාර්ගය වන අංක 5 දරන කැබැල්ලට බලයලත් මනින්දෝරු සී. ආර්. අඹවත්ත මහතා විසින් 1971.06.14 වැනි දින මැන සාදන ලද අංක 213 දරන පිඹුර ප්‍රකාර පර්චස් එකයි දශම අටයි එකක් (අ. 0, රූ. 0, පර්. 1.81) විශාල ඉඩම වේ.

වැඩි විස්තර සඳහා 2012.03.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2012.08.16 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් හා තිනකරන් යන පුවතපත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීමේ මාර්ගය* .- ගාල්ල නගරයේ සිට කොළඹ දෙසට යන විට කළුවැල්ල හන්දියෙන් දකුණට ඇති රිච්මන්ඩ් කන්ද පාරේ මීටර් 100ක් පමණ ගිය විට පාරේ දකුණු පස වරිපනම් අංක 24 දරන මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදිලින් ගෙවීම් කළ යුතු ය.

01. ගැණුම් මිලෙන් 10% ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ගාල්ල, පහළ ඩික්සන් පාරේ, අංක 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාර මහතාට ගෙවිය යුතු ය.

*දුරකථන අංක* : 091 2232311, 2234785, 2234171 හා 2223564
*ෆැක්ස් අංකය* : 091 2232230.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත කී ලිපිනයෙන් ලබා ගත හැකි ය.

ඉහත සඳහන් කරන ලද පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිනීමට බැංකුවට අයිතිය ඇත.

කේ. පී. එන්. සිල්වා (සා. වි.),
අධිකරණ රාජ්‍ය හා වාණිජ බැංකු පිළිගත්
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස්.

ඉන්ටර්ස්ටේට් ඔක්ෂන්ස්,
අංක 117/36, 1/1, ඇල්විටිගල මාවත,
කොළඹ 08.
දුරකථන අංක 077 - 1006829, 071- 8531500, - 011 - 5925957.
ඊ මේල් : premalalnsilva@gmail.com

01-241

---

සෙලාන් බැංකුව පීඑල්සී - මාවතගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 04 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාවතගම පදිංචි ලොකු ගුරුන්නැහෙලෑ ගෙදර මොහොමඩ් ෂෙරීෆ් මොහොමඩ් හිදයතුල්ලා යන අය බන්ධනදයි වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එම්. එස්. ද සේරම් විසින් සහතික කරන ලද 2014 අප්‍රේල් මස 30 දිනැති අංක 2538 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති දේපළ,

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම මහ නගර සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගංගොඩවිල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 2008.01.24 දිනැති අංක 4/08 සැලැස්මේ නිරූපනය වන බක්මීගහවත්ත (දැන්) සහ කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 02 ලකුණු කළ ඉඩම් කොටස ප්‍රමාණයෙන් (අ. 0, රූ. 0, පර්. 16.01)ක් විශාල ගොඩනැගිලි වගා සහ එහි පිහිටි සියලු දේ ද සමග බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 1993.08.31 දිනැති අංක 407 දරන සැලැස්මේ සඳහන් ලොට්ස් 1 සහ 2 ලකුණු කළ හැරවුම් කව සියල්ල පාවිච්චි කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතිය සහ ඉහත සඳහන් අංක 4/08 දරන සැලැස්මේ ලොට් 4 මාර්ග අයිතින් වශයෙන් පොදුවේ පාවිච්චි කිරීම සමග ඉඩම මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග -

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම මහ නගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගංගොඩවිල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 2014.03.31 දිනැති අංක 10/14 සැලැස්මේ නිරූපනය වන බක්මීගහ ඕවිට නැමති ඉඩමේ ලොට් 1 (බලයලත්

මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 4/08 සැලැස්මේ ලොට් 4 හි කොටසක්) ප්‍රමාණයෙන් (අ. 0, රූ. 0, පර්. 1.72) මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම මහනගර සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගංගොඩවිල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 2014.03.31 දිනැති අංක 10/14 සැලැස්මේ නිරූපනය වන බක්මීගහ ඕවිට නමැති ඉඩමේ ලොට් 2 (බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 4/08 සැලැස්මේ ලොට් 4 හි කොටසක්) ප්‍රමාණයෙන් (අ. 0, රූ. 0, පර්. 1.78) මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම මහනගර සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගංගොඩවිල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 2014.03.31 දිනැති අංක 10/14 සැලැස්මේ නිරූපනය වන බක්මීගහ ඕවිට නමැති ඉඩමේ ලොට් 3 බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 4/08 සැලැස්මේ ලොට් 4 හි කොටසක්) ප්‍රමාණයෙන් (අ. 0, රූ. 0, පර්. 0.22) මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2016ක් වූ ජනවාරි මස 19 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - නුගේගොඩ හන්දියේ සිට හයිලෙවල් පාර දිගේ ගංසභා හන්දිය දක්වා සහ එහි දකුණු පසින් ඇති පැපිලියාන පාරට දෙසට හැරී මීටර් 400 ග්‍රීන් කැබින් බේකරිය දක්වා පැමිණ එහි ඉදිරි පසින් ඇති පුද්ගලික පාර දිගේ මීටර් 150 ගොස් දකුණට හැරී මීටර් 50ක් ගිය විට මෙම දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.*- 2014.12.05 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ ද,* 2014.11.22 දිනැති ඩේලිමිර් ලංකාදීප සහ 2014.11.17 දිනැති තිනක්කුරල් පුවත්පත්හි පළ වී ඇත.
*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. -

01. ගැණුම් මිලෙන් 10% ;
02. පළාත් අධිකාරියේ බදු සඳහා 1% ;
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5% ;
04. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000 ;
05. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 500 ;
06. සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය ;
07. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද.

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳන් පරිදි ඉතිරි මුදල් නියමිත කාල සීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී නීති සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2456485, 011- 2456479.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම
දුරකථන අංක 0714318252, 011 - 2173282.

01-252

---

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හලාවත දිසා අධිකරණයේ දී ය.

සෙලාන් බෑන්ක් පීඑල්සී,
සෙලාන් ටවර්ස්,
අංක 90, ගාලු පාර, කොළඹ 03.

......................*පැමිණිලිකරු*

නඩු අංකය :
4423/13/MB

*එදිරිව*

1. ක්‍රිෂ්නන් රවිචන්ද්‍රන්,
2. සී. කුමුදුනී

*දෙදෙනාම*

අංක 15,
ඇලපාර,
වට්ටක්කුලිය, හලාවත.

.......................*විත්තිකරුවන්.*

ඉහත සඳහන් නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2014 සැප්තැම්බර් මස 17 වැනි දිනැති නියෝගය ප්‍රකාරව ඉහත විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට රුපියල් හතලිස් දෙලක්ෂ අසූ නව දහස් තුන්සිය හැටපහයි ශත පනහක (රු. 42,89,365.50) මුදලක් සහ රුපියල් තිස් ලක්ෂයක මුදලක් (රු. 30,00,000) මුදල මත 2013.01.19 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් වාර්ෂිකව 31% පොළියක් ද, නඩු ගාස්තු ද හිමිවිය යුතු බවට ද, අණකර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2016ක් වූ ජනවාරි මස 29 වැනි දින පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ උතුරු පිටිගල් කෝරළේ, ආනවිලුන්දන් පත්තුවේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආරච්චිකට්ටුව ග්‍රාම

නිලධාරී වසමේ එම්. එම්. පී. ඩී. පෙරේරා බලයලත් මානක විසින් මැන සාදන ලද අංක 4612 සහ වර්ෂ 2004.08.27 දරන පිඹුර ප්‍රකාර උතුරට : පී. පී. යු. 3429 හි කැබලි අංක 1 වශයෙන් නිරූපිත පාරකට වෙන්කර ඇති බිම් තීරය, නැගෙනහිරට : පී. පී. පු. 3429 හි නිරූපිත කැබලි අංක 08 ද, දකුණට : පී. පී. ඒ. 459 හි නිරූපිත කැබලි අංක 03 පී. පී. පු. 3429 හි නිරූපිත කැබලි අංක 21 ද, බස්නාහිරට : පී. පී. පු. 3429 හි නිරූපිත කැබලි අංක 1 දරන පාරකට වෙන්කරනු ලබන බිම් තීරය ද, මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකකුත් රූඩ් තුනකුත් පර්චස් විසි හතරයයි දශම හතරක් (අ. 01, රූ. 03, පර්. 24.4) *හෙවත්* හෙක්ටයාර් 0.770 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු සහ ගොඩනැගිලි ආදී ඊට අයත් සෑම සියලු දේ ද වේ.

*දේපළට පිවිසීම* .- හලාවත පුත්තලම පාරේ කි. මී. 86 කණුව පසුකර වම් දෙසට ඇති ප්‍රසන්න රණවිරු මාවත ඔස්සේ මීටර් 200ක් යාමේ දී සමෘදි මාවත හමුවීමට පෙර වම් දෙසට ඇති පාරෙන් මීටර් 100 යාමේ දී වම් දෙසට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

01. ගැණුම් මිලෙන් 25%.
02. පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
04. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 500,
06. සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය,

ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳන් පරිදි ඉතිරි මුදල් නියමිත කාල සීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී - නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90 ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක 011- 2456485, 011- 2456479.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම
දුරකථන අංක : 0714318252, 011- 2173282.

01-250

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ දිසා අධිකරණයේ දී ය

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
බෑන්ක් ඔෆ් සිලොන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.
*පෙර*
එම් බී එස් එල් සේවින්ග්ස් බෑන්ක් ලිමිටඩ්
අංක 97, හයිඩ් පාර්ක් කෝනර්,
කොළඹ 02
*පෙර නාමය*
සෙලින්කෝ සේවින්ග්ස් බෑන්ක් ලිමිටඩ්,

*නඩු අංකය* :
DMB 00164/09

........................*පැමිණිලිකරු* .

*එදිරිව*

පැලමන්දදිගේ සමන්ති දීප්තිකා ප්‍රනාන්දු,
අංක 43 සී, ප්‍රඥානන්ද මාවත,
වෑකඩ, පානදුර,

.............................*විත්තිකරුවන්.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් ව ඇති විකිණීමේ නියෝගය අනුව වර්ෂ 2012ක් වූ සැප්තැම්බර් මස 03 වැනි දින දරන තීන්දු ප්‍රකාශය පරිදි ඉහත නම සඳහන් විත්තිකරු පැමිණිලිකාර සමාගමට රුපියල් එක් මිලියන හත් ලක්ෂ හැට දෙදහස් තුන්සිය දෙකයි ශත අනූ හතරක (රු. 17,62,302.94) ණය මුදල මත 2009.02.18 සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා වසරකට 18.5% ක පොළියක් ද තීන්දු ප්‍රකාශයේ දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු තීන්දු ප්‍රකාශයේ සඳහන් මුලු මුදල සඳහා 18.5% පොලියක් ද ගෙවීමට නියෝග ඇත. ඉහත විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට එකී මුදල් ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2016ක් වූ ජනවාරි මස 22 වැනි දින පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, අධිකාරි පත්තුවේ, රඹුක්කන මෙහි පිහිටි සර් ජෝන් කොතලාවල මාවතේ, වරිපනම් අංක 55 දරන බෙලිගහවත්ත නමැති ඉඩමට කේ. ආර්. පෙරේරා මානක තැන විසින් වර්ෂ 2000ක් වූ පෙබරවාරි මස 21 වැනි දින මැන සාදන ලද අංක 1368 දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද කැබලි අංක 02 ට මායිම් උතුරට : ඉහත කී පිඹුරු අංක 1368 හි කැබලි අංක 01 ද, නැගෙනහිරට : තලගහවත්ත *හෙවත්* පේරගහවත්ත ද, දකුණට : මෙම ඉඩමේ කැබලි අංක 07 ද, බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසි තුනක් (අ. 0 රූ. 0 පර්. 23) විශාල ඉඩම ඒ තුළ පිහිටි ගහකොළ ඇතුළු සියලුදේ ද සමග වේ.

ලියාපදිංචිය : බී/172/168 හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය.

*දේපළට ප්‍රවේශ මාර්ගය* .- මෙම දේපළ පිහිටා ඇත්තේ කොළඹ සිට බණ්ඩාරගම නගරය දක්වා සහ එතැන් සිට පානදුර මාර්ගය ඔස්සේ මීටර් 900 මීටර් ගොස් දකුණු පසින් වන්නට ඇති රණවිරු නීල් දූරනියගල මාවත හමුවේ. එම පාර ඔස්සේ මීටර් 150 ගිය විට දකුණු අත පැත්තට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

01. ගැණුම් මිලෙන් 25%,
02. පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
04. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 1,500,
06. සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය,

ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාල සීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකරු නීති - මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.
දුරකථන අංක 011- 4711711.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම
දුරකථන අංක : 0714318252, 011- 2173282.

01-251

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **ජනවාරි** | 2016.01.01 | සිකුරාදා | 2016.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.08 | සිකුරාදා | 2016.12.23 | බදාදා | දහවල් | 12.00 |
| | 2016.01.14 | බ්‍රහස්පතින්දා | 2016.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.22 | සිකුරාදා | 2016.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.29 | සිකුරාදා | 2016.01.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2016.02.05 | සිකුරාදා | 2016.01.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.02.12 | සිකුරාදා | 2016.01.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.02.19 | සිකුරාදා | 2016.02.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.02.26 | සිකුරාදා | 2016.02.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2016.03.04 | සිකුරාදා | 2016.02.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.03.11 | සිකුරාදා | 2016.02.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.03.18 | සිකුරාදා | 2016.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.03.24 | බ්‍රහස්පතින්දා | 2016.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.